# අංක 32 අලව්ව සමථ මූල මණ්ඩලයට නව සභිකයින් තෝරා පත්කර ගැනීම සඳහා නාමයෝජනා කැඳවීම

**අවශ්‍ය සුදුසුකම්**

1. ඔබ බල ප්‍රදේශයේ පිහිටි එක් ග්‍රාම නිලධාරි වසමකින් එක් අයෙක්වත් නම් කිරීම මැනවි.
2. නිර්දේශ කළයුතු තැනැත්තා හෝ තැනැත්තිය පසුගිය වසර 10ක කාලයක් තුල කිසිදු ක්‍රියාකාරි දේශපාලන කාර්යයකට සම්බන්ධ නොවූ අධිකරණමය කාර්යයකට සුදුසුයැයි ප්‍රදේශයේ ජනතාව පිළිගන්නා අවංක, චරිතවත්, සද්භාවයෙන් යුතු පුද්ගලයන් විය යුතුය.
3. සමථ මූල මණ්ඩලවල කාන්තා නියෝජනය සැළකිය යුතු ලෙස වැඩි කිරීමට කොමිෂන් සභාව තීරණය කර ඇති බැවින් කාන්තාවන්ගේ නාමයෝජනා වැඩි වශයෙන් එවීමට කටයුතු කරනු මැනවි.
4. රාජ්‍ය/අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ මූල්‍ය කටයුතුවලට සම්බන්ධ බැංකු, කල්බදු, ක්ෂුද්‍ර මූල්‍ය ණය හා රක්ෂණ සේවාවේ නියුතු ආයතනයන්හි දැනට සේවයේ යෙදී සිටින තැනැත්තන්ගේ නාමයෝජනා සළකා බලනු නොලැබේ.
5. දැනට සේවයේ යෙදී සිටින සමථකාරවරුන් හැර නවක නාම යෝජිතයන්ගේ වයස අවම වශයෙන් අවුරුදු 35ක් ඉක්මවා තිබිය යුතුය.
6. රජයේ හෝ පෞද්ගලික සේවාවන් වල හෝ ස්වයං වෘත්තීන් වල දැනට යෙදී සිටින හෝ යෙදී සිටි විශ්‍රාමික ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් මෙන්ම පූජ්‍ය පක්ෂයේද නිර්දේශයන් බලාපොරොත්තු වෙමු.